# දරුවන් උදෙසා
# බයිබලයක්

# මිනිසාගේ දුකෙහි
# පටන්ගැන්ම




**ඉදිරිපත් කරන්නා**: Edward Hughes

**නිදර්ශනය කරන්නා**: Byron Unger; Lazarus

**අදහසක් වඩා සරල ස්වරූපයකින් ප්‍රකාශ කරන්නා**

**සකස්කරන්නා**: M. Maillot; Tammy S.



60 - 2 **වන කථාන්තරය**

**www.M1914.org**

***Bible for Children,*** *PO Box 3, Winnipeg, MB R3C 2G1 Canada*



**අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.**


සිංහල

Sinhalese








''එම පලතුර
කෑවොත් හෝ
ඇල්ලුවොත් අපි
මැරෙයි'' ඒව කීවා.
''එය බොරුවක්.
ඔබ මැරෙන්නේ
නැහැ'' සර්පයා
සිනාසෙමින් කීවා.
3


''ඔබ දෙවියන්
වහන්සේ වගේ
වෙනවා'' ඒවට
එම ගසේ
පලතුරු කෑමට
අවශ්‍ය වුණා.
ඇය සර්පයාගේ
වචන අසා එම
පලතුර කෑවා.
4


ඒව දෙවියන් වහන්සේට අකීකරු වූ
අතර ආදම්ට ද එම ගෙඩිය කෑමට
සැලැස්සුවා. ''බැහැ, මම දෙවියන්
වහන්සේගේ අණට අකීකරු
වෙන්නේ නැහැ''
යි ආදම්ට
කියන්න
තිබුණා.
5


ආදම් සහ ඒව දෙවියන් වහන්සේගේ
අණට අකිකරු වී පව් කළායින් පසු
ඔවුනට තේරුම් ගියා, ඔවුන් නිරුවත් බව.
6


අත්තික්කා කොළවලින් ඇඳුම් මසාගෙන
තම නිරුවත් බව වසාගෙන දෙවියන්
වහන්සේගෙන් සැඟවිලා ගස් අතර සිටියා.
7


සවස් කාලයේදී දෙවියන් වහන්සේ උයනට
පැමිණි සේක. ආදම් සහ ඒව කළ ඇති
දෙය උන් වහන්සේ දැනගත්තා. ආදම්
සහ ඒව වරදකරුවන් බවට පත්වුණා.
ඒව සර්පයා පිට වරද තැබුවා. ''සර්පයා
සාපලත් බවත්, කාන්තාව වේදනා සහිතව
දරුවන් බිහිකරන බවත්'' දෙවියන්
වහන්සේ වදාළ සේක.
8


ආදම්, ඔබත් පව් කළ නිසා පොළොව
ශාපයට ලක් වේ. එහි කටු ද විෂ සහිත
ගස් ද පවතිනු ඇත. ඔබගේ දිනපතා
ආහාරය සඳහා ඉතා මහන්සි වී වැඩ
කිරීමට ඔබට සිදුවනු ඇත.
9


දෙවියන් වහන්සේ
ආදම් සහ ඒව උයනෙන් පිටතට යැවූ
සේක. ඔවුන් දෙවියන් වහන්සේට
අකීකරු වූ නිසා දෙවියන්
වහන්සේගේ
සදාකාල
ජීවනයෙන්
ඈත් වුණා.
10


දෙවියන් වහන්සේ
ඔවුන් පිටත තැබීම සඳහා ගිනිමය
කඩුවක් සෑදූ සේක. ආදම් සහ ඒව
සඳහා සම්වලින් ඇඳුමක් සාදා දුන්
සේක. දෙවියන්
වහන්සේ සම්
සොයාගත්තේ
කෙසේද?
11


කල්ගත වෙත්ම ආදම් සහ ඒව පවුලක් බවට පත්වුණා.
ඔවුන්ගේ වැඩිමහල් පුතා කායින්, වගාකරන්නකු වූ අතර
දෙවන පුත්, ආබෙල් එඬේරෙක් විය. එක දවසක් කායින් තම බෝග
රැගෙන දෙවියන් වහන්සේට පූජා කළා.
12


ආබෙල් ඔහුගේ බැටළු රැළෙන් හොඳම බැටළුවා රැගෙන දෙවියන්
වහන්සේට පූජා කළා. දෙවියන් වහන්සේ ආබෙල්ගේ පූජාවට සතුටු
වුණා.
13


දෙවියන් වහන්සේ කායින්ගේ පූජාව ගැන
සතුටු වුණේ නැහැ. කායින්ට දරාගත
නොහැකි ආකාරයට කේන්ති ගියා.
14

කායින්ගේ කේන්තිය ඔහුගෙන් ඉවත් වුණේ
නැහැ. ටික කලකට පසු ඔහු කෙතේ දී
ආබෙල්ට පහර දී ඔහු මරා දැමුවා.



15

''ඔබේ සහෝදර ආබෙල් කොහේද?''
දෙවියන් වහන්සේ කායින්ගෙන් ඇසුවා.
''මම දන්නේ නැහැ'' කායින් බොරු
කීවා. ''මම මගේ සහෝදරයාගේ
රැකවලාදැ'' යි කායින් විමසුවා.



16

දෙවියන් වහන්සේ, බෝග වගාව
සඳහා කායින් සතුව තිබූ හැකියාව,
ඉවත් කොට ඔහු ඔබමොබ
යන්නෙක් බවට පත් කළ සේක.



17

කායින් දෙවියන් වහන්සේගේ අභිමුඛයෙන්
ඉවත් විය. ආදම් සහ ඒවගේ දියණියක්
සමඟ විවාහ වී පවුලක් ලෙස වර්ධනය විය.
කායින්ගේ දරු මුණුබුරෝ ඉතා ඉක්මණින්
දේශය පුරා පැතිර ගියහ.



18

ආදම් සහ ඒව ඇතුළු පවුල ද ඉතා ඉක්මණින්
වර්ධනය විය. එම අවධියේ ජනයා බොහෝ
කාලයක් ජීවත් වූහ.



19

ඒව සෙත් බිහි කළ විට, ''දෙවියන් වහන්සේ
ආබෙල් වෙනුවට මට සෙත් දුන් සේකැ'' යි කීවාය.
සෙත් දෙවියන් වහන්සේට බොහෝ ලැදි මිනිසෙක්
වූවා. ඔහු බොහෝ දරු මුණුබුරන් බිහිකොට වසර
නවසිය දොළහක් දිවි ගෙව්වා.



20













**මිනිසාගේ දුකෙහි පටන්ගැන්ම**

A story from God's Word, the Bible,

is found in

උත්පත්ති 3-6

"ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ"
ගීතාවලිය 119:130

දෙවියන් වහන්සේ දන්නවා, අප වැරදි කර ඇති බව. එම වැරදි උන් වහන්සේ පාපය ලෙස හඳුන්වන සේක. පාපයේ කුලිය නම් මරණයයි.

උන් වහන්සේ ජීවමානව නැවත ස්වර්ගයට නැගුණු ණිසා අපගේ පාප උන් වහන්සේට කමා කළ හැක. ඔබට පාපයෙන් මිදීමට අවශ්‍ය නම් දෙවියන් වහන්සේට කියන්න.

ආදර දෙවි පියාණෙනි, ජේසුස් වහන්සේ මා වෙනුවෙන් මැරී නැවත නැගිටුණු බව මම විශ්වාස කරමි. මගේ ජීවිතයට පැමිණ මගේ පව්වලට කමාව දුන මැනව. එවිට මට ඔබ වහන්සේ සමඟ නව ජීවිතයක් ගත කළ හැක. සදාකාලයටම ඔබ සමඟ ඔබේ දරුවකු ලෙස ජීවත්වීමට උදව් කළ මැනව. ආමෙන්.
ජොහන් 3:16

සැමදාම බයිබලය කියවමින් දෙවියන් වහන්සේට යාච්ඤා කරන්න.